GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2012/07/23

# මාධ්‍ය නිවේදනයයි

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින්, වෛද්‍ය ආඥා පනතට මත භේදාත්මක සංශෝධන කිහිපයක් ඇතුලත් කිරීම සඳහා රජයේ නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ පිලිබඳව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාජිකත්වය තුල නොසන්සුන්තාවයක් හටගෙන ඇත.

2012/07/05 දින පැවැත්වූ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ විධායක සභා රැස්වීමේදී මේ පිළිබඳ කරුණු සොයා බැලීමට වෛද්‍ය කේ.එච්.ඩී මිල්රෝයි සහ වෛද්‍ය එස්.එච් කොළඹගේ යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරන ලද අතර, මෙම කමිටුව මගින් සිදුකල විමර්ශන වලදී හෙළිදරව් වූයේ වෛද්‍ය ආඥා පනත සංශෝධනය සඳහා මූලික පියවර 2006 වර්ෂයේදී ආරම්භවී ඇති බවත්, 2011 වර්ෂයේ මුල්භාගයේදී ඉහත කී මත භේදාත්මක සංශෝධන කෙටුම්පත් ගත කෙරී ඇති බවයි. මෙම සංශෝධන පිටුපස මාලඹේ ව්‍යාජ වෛද්‍ය උපාධි ආයතනය ස්ථාවර කිරීමට අවශ්‍ය නීතිප්‍රතිපාදන ලබාදීමේ යටි අරමුණක් තිබී ඇති බවට හෙලිදරවු වී ඇත.

මේ අතර එක්තරා වෛද්‍ය කණ්ඩායමක් මෙම සංශෝධන වලට විරුද්ධව, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෙත යොමු කිරීමට පෙත්සමක් අත්සන් ලබා ගනිමින් සිටින බවද රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට වාර්ථා වී ඇත.

කෙසේ වෙතත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඇතුළු අදාල පාර්ශවයන් අතර පුලුල් කතිකාවතකින් තොරව කිසිදු සංශෝධනයක් වෛද්‍ය ආඥා පනතට ඇතුලත් නොකල යුතු බවට කමිටුව මගින් කල නිර්දේශය රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ විධායක සභාව ඒකමතිකව අනුමත කල අතර, ඉහත කෙටුම්පත මුලුමනින්ම පරාජය කිරීමට අවශ්‍ය පියවර 2012/07/29 දින රැස්වන මාධ්‍යම කාරක සභාවේදී සාකච්ජා කෙරෙනු ඇත.

ස්තූතියි,

වෛද්‍ය චන්දික එපිටකඩුව.
ලේකම්.

වැඩිදුර විස්තර :

| | | |
|---|---|---|
| වෛද්‍ය නවීන් සොයිසා | : | 0718582444 |
| වෛද්‍ය නලින් ආරියරත්න | : | 0714800942 |
| වෛද්‍ය නලින්ද හේරත් | : | 0717876516 |